**ශ්‍රීලංප්‍ර 1258 : 2004 දරන අටපිරිකර පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර සඳහා නිකුත් කරන ලද සංශෝධන අංකː 1 හි කෙටුම්පත**

**පැහැදිලි කිරීමේ සටහන**

මෙම සංශෝධනය නිකුත් කරන්නේ ශ්‍රීලංප්‍ර 1258 : 2004 දරන අටපිරිකර ප්‍රමිතියේ පාත්‍ර සඳහා අවශ්‍යතා අන්තර්ගත කර තිබූ නමුත්, කමිටු සාමාජිකයන්ගේ අදහස් සහ යෝජනා පරිදි පාත්‍ර සඳහා වෙනම ප්‍රමිති පිරිවිතරයක් සකස් කිරීමට තීරණය කරන ලදී. එමෙන්ම දැලි පිහිය සඳහා අදාල පරිදි මිනුම් වෙනස් කිරීමට ද තීරණය කරන ලදී.

එබැවින් මෙම සංශෝධනය ඉදිරිපත් කිරීමට තීරණය කෙරුණි.

AMD. 355

2007.05-28

**2007........දින අනුමැතිය ලත් ශ්‍රීලංප්‍ර 1258 : 2004 දරන අටපිරිකර පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර සඳහා නිකුත් කරන ලද සංශෝධන අංකː 1 හි කෙටුම්පත**

***3.2.4 පාත්‍රය***

එම ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ඇතුළත් කරන්න.

"පාත්‍රය ශ්‍රීලංප්‍ර..........ට අනුකූල විය යුතුය".

***3.2.6 දැලි පිහිය***

එම ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ඇතුළත් කරන්න.

"දැලි පිහිය වානේ වලින් නිම කොට තිබිය යුතුය. පිහිතලයේ දිග අවම වශයෙන් 75 mm (අඟල් 3) ක් සහ පළල අවම වශයෙන් 22 mm (අඟල් 7/8) ක් විය යුතුය. පිහිතලයේ මිටෙහි දිග අවම වශයෙන් 65 mm (අඟල් 2 1/2ක්) විය යුතු අතර, ආවරණයෙන් දිග අවම වශයෙන් 120mm (අඟල් 4 3/4) ක් විය යුතුය"

**අ.1 පරිශිෂ්ඨය**

නියැදීම හා අනුකූලතාව සඳහා මිනුම් දඬු

දැනට යොදා ඇති වගුව ඉවත් කර පහත සඳහන් වගුව ඇතුළත් කරන්න.

**අ.1 වගුව - නියැදීමේ පරිමාණය**

| අනු අංකය (1) | තොගයේ ඇති අටපිරිකර ගණන (2) | තෝරා ගත යුතු අටපිරිකර ගණන (3) | පිළිගැනුම් අංකය (4) |
|---|---|---|---|
| **i** | 25 දක්වා | 02 | 0 |
| **ii** | 26 සිට 150 දක්වා | 03 | 0 |
| **iii** | 151 සිට 500 දක්වා | 05 | 0 |
| **iV** | 501 සිට 3200 දක්වා | 08 | 0 |
| | 3201 සිට ඉහළට | 13 | 1 |